# ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

# 2021.12.31 දිනට ක්‍රියාත්මක සැලැස්ම අනුව ප්‍රගතිය

## ජාතික සමූපකාර සංවර්ධන ආයතනය- පොල්ගොල්ල

**2021.12.31 දිනට ප්‍රගතිය**

| | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | සමූපකාර සමිති වෙත උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | සමිති 50 ක් සඳහා | අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සමූපකාර සමිති සඳහා නොමිලේ උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතින අතර ඒ සඳහා සමිති 125 හඳුනාගෙන ඇත. එම සමිති සඳහා උපදේශකවරු 43 නම් කර ඇත. ඒ අනුව වි.සේ.ස සමිති 21 , සණස සමිති 14 , නිෂ්පාදන සමිති72, සමිති සංගම් 2, සමූපකාර බැංකුවක් හා වෙනත් සමිති 10 සඳහා නොමිලේ උපදේශන සේවා ක්‍රියාත්මක කරමින් පවතී. |
| 02. | සමූපකාර දෙපාර්තමේන්තු හා සමිති නිලධාරි වෙනුවෙන් පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම. | | |
| | i. උපාධි පාඨමාලාව | අනුමැතිය ලබා ගැනීම | මේ සඳහා පළමුව ආයතනයේ පනතෙහි විධිවිධාන ඇතැම් වගන්ති සංශෝධනය කිරීම සිදුකළ යුතු බව දැනුම් දී තිබේ. |
| | ii. උසස් ජාතික ඩිප්ලෝමාව | පාඨමාලා 02 කි | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ප්‍රමාණවත් අයදුම්පත් නොලැබීම නිසා පාඨමාලා ආරම්භ නොකරන ලදි. 2022 ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතය. |
| | iii. ඩිප්ලෝමා පාඨමාලාව | පාඨමාලා 10 කි. | අලෙවි හා ව්‍යාපාර සංවර්ධන ඩිප්ලෝමාව, මානව සම්පත් කළ ඩිප්ලෝමාව හැර අනෙකුත් සියළු ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කර ඇත. |
| | iv. සහතික පත්‍ර පාඨමාලා | පාඨමාලා 03 කි | ක්‍රියාත්මක වේ.<br><br>2021 දෙසැම්බර් මස 28 දින ආරම්භ කරන ලදී. |
| | v. කෙටිකාලීන පාඨමාලා | පාඨමාලා 21කි. | මේ වන විට කෙටිකාලීන පාඨමාලා 9 ක් පවත්වා ඇති අතර සිදුකිරීමට නියමිත කෙටිකාලීන පාඨමාලා පිළිබඳ WhatsApp මගින් සමිති හා සමූපකාර සංවර්ධන කොමසාරිස් දෙවරක් දැනුවත් කර අයදුම්පත්‍ර කැඳවා ඇත. ප්‍රමාණවත් අයදුම්පත්‍ර ප්‍රමාණයක් ලැබී නොමැත. |
| | vi. වෘත්තීය පාඨමාලා | පාඨමාලා 05කි. | අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල නිකුත්වීම ප්‍රමාද වූ බැවින් හා ඉලක්ක කණ්ඩායමද එම සිසුන් බැවින්ද මෙම වසරේ පැවැත්වීමට නොහැකි වේ. |

<u>ජාතික සමූපකාර සංවර්ධන ආයතනය- පොල්ගොල්ල</u>

**2021.12.31 දිනට ප්‍රගතිය**

| | | | |
|---|---|---|---|
| | vii. වැඩමුළු | එක් දින වැඩමුළු 130ක් පමණ | සමූපකාර ක්ෂේත්‍රයේ සියළු නිලධාරීන් ආවරණය වන පරිදි එක් දින වැඩමුළු ආයතන පරිශ්‍රය තුළ 02 ක් ද, මාර්ගගත ක්‍රමයට වැඩමුළු 48 ක් ද ක්‍රියාත්මක කර ඇත. |
| | viii. අත්දැකීම් හුවමාරු වැඩසටහන් | වැඩසටහන් 12 ක් | මෙම වැඩසටහන් 12 වෙනුවට අත්දැකීම් හුවමාරු වැඩසටහන් 07ක් නොමිලේ පැවැත්වීමට සැලසුම් කර ඇත. දැනට වැඩසටහන් 04 ක් සිදු කර ඇත. |
| 03. | පුහුණු පාඨමාලා සංවර්ධනය | | |
| | i. පාඨමාලා අන්තර්ගතයන් යාවත්කාලීන කිරිම | පාඨමාලා 15ක් | ඩිප්ලෝමා පාඨමාලා 10 සඳහා NVQ මට්ටම් ලබාගැනීමට පාඨමාලා සංශෝධන කටයුතු හා කාර්යාල පිරිසැකැස්ම සකස් කරමින් පවතී. |
| | ii .නව පාඨමාලා හඳුන්වා දීම | පාඨමාලා 03ක් | නව පාඨමාලා 03ක් හඳුන්වාදීමට කටයුතු කරමින් පවතී. |
| 04. | පාඨමාලා වල තත්තවය වර්ධනය කිරීම | | |
| | i.NVQ මට්ටම් ලබා ගැනීම. | පාඨමාලා 10 ක් සඳහා | සමස්ත ආයතනයට අදාළ අවශ්‍යා ලියවිලි ප්‍රමිතියට අනුව සකස් කරමින් පවති. |
| | ii.SLQF මට්ටම් ලබා ගැනිම. | පාඨමාලා 10 ක් සඳහා | සමස්ත ආයතනයට අදාළ අවශ්‍යා ලියවිලි ප්‍රමිතියට අනුව සකස් කරමින් පවති. |
| 05 | බාහිර ඉල්ලීම් මත වැඩ සටහන් සංවිධානය | | ශ්‍රී ලංකා පරිපාලන සේවා නවක නිලධාරි පුහුණුව සඳහා ආයතනය පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතා කිරිම.<br>කොවිඩ් 19 වෛරස තත්වය මත බාහිර ඉල්ලීම් අවම මට්ටමක පවතී. |
| | සමූපකාර ග්‍රන්ථ ප්‍රකාශනය කිරීම. | ග්‍රන්ථ 03 ක් | මහාචාර්ය දයා අමරසේකර මයා විසින් කතෘ මඩුල්ල දැනුවත් කිරිම සඳහා 2021.07.15 Zoom Meeting මඟින් රැස්වීමක් පවත්වන ලදි. කතෘ මඩුල්ල හඳුනාගෙන ඇත.<br>මෙම ව්‍යාපෘතිය සඳහා මාර්ගෝපදේශය සකස් කර ඇත |

| | | | |
|---|---|---|---|
| 06. | සමූපකාර පර්යේෂණ සිදු කිරිම. | | |
| | i.ආයතනයේ පුහුණුලාභීන් (සමූපකාර සංවර්ධන නිලධාරීන්) මඟින් පර්යේෂණ සිදු කිරීම. | පර්යේෂණ සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම. | 2021.07.26 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානි, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් හා ආයතනයේ අදාළ නිළධාරීන් සමඟ සාකච්ඡාව පරිදි සංශෝධිත පර්යේෂණ යෝජනාවලියට අදාළ තොරතුරු පේරාදේණිය විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇත. |
| | ii බාහිර ආයතනවල සිසුන් මඟින් පර්යේෂණ සිදු කරවා ගැනිම. | | විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ලියවිලි සකස් කරමින් පවතින බව දන්වන ලදී.<br><br>පර්යේෂණ සඳහා ගිවිසුම්ගත වීමට ලබන ජනවාරි මස සිට සූදානම්ව සිටී.<br><br>මේ සඳහා වන ක්‍රමවේදය සකස් කර විශ්වවිද්‍යාල උප කුලපතිවරුන් වෙත යැවීමට කටයුතු කර ඇත.<br><br>සබරගමුව විශ්වවිද්‍යාලය පර්යේෂණ යෝජනාවලිය එවා ඇත.තව පර්යේෂණ යෝජනා 2 ක් පමණ එවීමට කටයුතු කරන බව දන්වන ලදී.<br><br>රජරට විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ යෝජනාවලියක් එවන බව දන්වන ලදී. |
| 07. | සමූපකාර තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම. | තොරතුරු පද්ධතිය | තොරතුරු පද්ධතිය සඳහා වන ආකෘතිය සකස් කර ඇති අතර මේ පිළිබඳව සාකච්ඡා කිරීමට අවසන් සාකච්ඡාවක් සූදානම් කර ඇත. |
| 08. | ආයතනික ධාරිතා සංවර්ධනය | | |
| | i.ජාත්‍යන්තර සමූපකාර දින ජාතික වැඩසටහන | | ජාත්‍යන්තර සමූපකාර දින ජාතික වැඩසටහන අප ආයතනය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද පවත්නා තත්වය හමුවේ එය පැවැත්වීමට නොහැකි වීම මත එය කොළඹ කේන්ද්‍ර කොට ගනිමින් පවත්වා ඇත. |
| | ii.ජාත්‍යන්තර සමූපකාර දින ආයතනික වැඩසටහන | | පොල්ගොල්ල මහජන බැංකු පරිශ්‍රය කේන්ද්‍රස්ථානය කරගනිමින් එම පරිශ්‍රය තුළ සියළුම අනර්ඝ තත්වයේ රෙදිපිළි ඇඟළුම් මෙන්ම පේෂකර්ම නිෂ්පාදන ඇතුළු අත්‍යවශ්‍ය සියළුම වියළි ආහාරපාන ලබාදීමේ අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් දින පහක් පුරා පවත්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | iii.වාර්ෂික සමූපකාර කතිකාවතක් පැවැත්වීම. | | මේ සඳහා මාර්ගගත ආකාරයට webinar (සමූපකාර කතිකාවතක්)නොවැම්බර් මස පැවැත්විමට නියමිතය. |
| | iv.NICD දිනය සැමරීම. | | පැවැති කොවිඩ් 19 තත්වය තුළ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක නොකරන ලද අතර ලේ දන්දීමේ වැඩසටහන පමණක් පවත්වා ඇත. |
| | v.වාර්ෂික සහතික පත්‍ර ප්‍රධානොත්සවය | | පවත්නා කොවිඩ් තත්වය හමුවේ ඒකරාශී වීම් සිදු කිරීමට නොහැකි වූ බැවින් සහ සහතික පත්‍ර ප්‍රදානය කිරිමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති විම මත එය ලබන වසර තුළ සිදු කිරිමට නියමිතය |
| | vi.වාර්ෂික ප්‍රකාශනය එළිදැක්වීම. | | මේ සඳහා අවශ්‍ය කටයුතු දෙසැම්බර් මාසය අග වන විට සම්පූර්ණ කිරීමට නියමිතය. |
| | vii.ජාත්‍යන්තර සමූපකාර සංවිධානයේ සාමාජිකත්වය පවත්වාගෙන යාම. | | සාමාජිකත්වය යාවත්කාලීන කරලීමට කටයුතු කර ඇත. |
| | viii.අන්තර්ජාතික සමූපකාර සංවිධාන සමඟ වැඩසටහන් පැවැත්වීම | | ZOOM තාක්ෂණය ඔස්සේ VAIKUNTHMETHA සහ CISTAB යන අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධ වී වැඩසටහන් පවත්වා ඇත. |
| | ix.සමාජ වගකීම් පිළිබඳ කාර්යයන් ඉටු කිරිම.(CSR) | සමාජ වගකීම් 01 | කොරෝනා රෝගය සම්බන්ධව නිරෝධායන කටයුතු සඳහා ආයතනික නේවාසිකාගාරය නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ලබා දී ඇත. |
| | x.සේවා ගුණාත්මකභාවය වර්ධනය කිරීම. ඵලදායිතා වැඩසටහන . | | සේවා ගුණාත්මකභාවය වර්ධනය කිරිම වෙනුවෙන් Quality Management System ක්‍රමවේදය හරහා කටයුතු කිරිමට අවශ්‍ය කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත. |

<u>ජාතික සමූපකාර සංවර්ධන ආයතනය- පොල්ගොල්ල</u>

**2021.12.31 දිනට ප්‍රගතිය**

| | | | |
|---|---|---|---|
| 09. | ආයතනයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම.<br>අනුමත තනතුරු 71 යි.<br><br>පුරප්පාඩු සංඛ්‍යාව 43 යි. | තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 28 දෙනෙකු බඳවා ගැනීම. | • දැනට නිලධාරීන් 26 දෙනෙකු බඳවාගෙන ඇත.<br>• කණිෂ්ඨ කාර්යය මණ්ඩල පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන වැඩසටහන යටතේ මේ වන විට නිලධාරීන් 07 දෙනෙකු පමණ ආයතනය වෙත අනුයුක්ත කර ඇත. |
| | ii.කාර්යය මණ්ඩල පුහුණුව | | මාර්ගගත ක්‍රමය ඔස්සේ පුහුණු වැඩමුළුආයතන කටයුතු හා මුදල් රෙගුලාසි පිළිබඳ කාර්යාල පුහුණු සැසි පවත්වා ඇත. |
| | iii.කාර්යය මණ්ඩල ඇගයීම | | අඛණ්ඩව සිදු කර ඇත. |
| | iv.කාර්යයමණ්ඩල සුභසාධනය | | සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද සඳහා පහසුකම් සපයා ඇත. |
| | v.කාර්යයමණ්ඩල රක්ෂණාවරණය | | මේ සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සමඟ සාකච්ඡා කල අතර එහිදී තීරණය වූයේ සියළු අර්ධ රාජ්‍ය ආයතන සඳහා පොදු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කරන බවත් එය ඉදිරියේ දී ප්‍රකාශ කරන බවත්ය . |
| 10 | භෞතික සම්පත් සංවර්ධනය | | |
| | i.ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණ කටයුතු | රු.මි.05 | රු.මි.02 ක කටයුතු සඳහා නැවත ඇස්තමේන්තු කිරීමට සිදු වී ඇත. |
| | ii.භාණ්ඩ මිලදී ගැනිම | රු.මි 10.975 | මිල දී ගැනීමේ කටයුතු සිදු කර ඇත. |
| 11. | ආයතනික පරිපාලන කටයුතු | | |
| | i.කළමනාකරණ මණ්ඩල රැස්වීම් | රැස්වීම් 10 | 2021.10.31 දක්වා කළමනාකරණ මණ්ඩල රැස්වීම් 07 ක් පවත්වා ඇත. |
| | ii.අධ්‍යයන මණ්ඩල රැස්වීම් | රැස්වීම් 08 | 2021.10.31 දිනට අධ්‍යයන මණ්ඩල රැස්වීම් 02 ක් පවත්වා ඇත. |

ජාතික සමූපකාර සංවර්ධන ආයතනය- පොල්ගොල්ල

**2021.12.31 දිනට ප්‍රගතිය**

| | | | |
|---|---|---|---|
| | iii.විගණන කළමනාකරණ කමිටු රැස්වීම් | රැස්වීම් 04 | 2021.10.31 දිනය වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් පවත්වා ඇත. |
| | iv.ක්‍රියාකාරී සැලැස්ම 2022 | | සකස් කොට අමාත්‍යංශය වෙත යොමු කොට ඇත. |
| | v.ප්‍රසම්පාදන සැලැස්ම 2022 | | සකස් කොට අමාත්‍යංශය වෙත යොමු කොට ඇත. |
| | vi.පුහුණු සැලැස්ම 2022 | | සකස් කොට අමාත්‍යංශය වෙත යොමු කොට ඇත. |
| | vii. අයවැය 2022 | | සකස් කොට අමාත්‍යංශය වෙත යොමු කොට ඇත. |
| | viii.අභ්‍යන්තර විගණන සැලැස්ම 2022 | | සකස් කරමින් පවතී. |
| | ix.වාර්ෂික වාර්තාව 2020 | | 2020 වාර්ෂික වාර්තාව සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
ජාතික සමූපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල